වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් සහිත සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ශිෂ්ට සම්පන්න භාෂාවකට කළ හැකි බලපෑමත්, ඒ සඳහා වඩාත් ශිෂ්ට සම්පන්න භාෂාවක් සමාජගත කිරීම උදෙසා මාධ්‍යයට ලබාදිය හැකි දායකත්වයත් පිළිබඳව අපි විටින් විට සාකච්ඡා කොට ඇත්තෙමු.

මේ ආකාරයේ ශිෂ්ට සම්පන්න භාෂාවක් දියුණු කිරීම උදෙසා පිටුදැකිය යුතු යෙදුම් සහ නාමකරණයන් තිබේ. "කුඩ්ඩා", "කුඩ්ඩී", "මත්ලෝලියා", "කුඩුලෝලියා" වැනි යෙදුම් ඒ අතර වේ. කුඩ්ඩා වැනි යෙදුමක් හා බැඳී ඇති ගර්හාත්මක, කොන් කිරීමේ අර්ථය සමගින්, මත්ද්‍රව්‍ය ඇබ්බැහියකින් යුක්ත වූ අයෙකුට පුනරුත්ථාපනය ඔස්සේ හෝ නැවත සමාජයට ඇතුළත් වීමට ඇති ඉඩ ඇවිරීමක් සිදු නොවන්නේදැයි අප විමසිය යුතුයි. එසේම මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු ගණනාවකින් යුතු හැසිරීමක් මිස, සරලව මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමක් නොවන බැවින්, 'මත්ලෝලියා', 'කුඩුලෝලියා' වැනි යෙදුම් ගැටළුකාරී නොවන්නේදැයිද අප විමසිය යුතුයි.

මෙවැනි යෙදුම් ශිෂ්ට සම්පන්න සමාජයකට යෝග්‍ය වන්නේදැයි අප ප්‍රශ්න කරන්නේ එම පදනමේ සිටයි.

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Divaina #Dinamina #Mawbima**